# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## වාග්විද්‍යා අධ්‍යයන අංශය, මානවශාස්ත්‍ර පීඨය

## විශ්වවිද්‍යාල ප්‍රවේශය 2015/2016

# යෝග්‍යතා පරීක්ෂණය

**ශාස්ත්‍රවේදී (විශේෂ) භාෂා පරිවර්තන අධ්‍යයන උපාධි පාඨමාලාව**

ශාස්ත්‍රවේදී (විශේෂ) භාෂා පරිවර්තන අධ්‍යයන උපාධි පාඨමාලාව

වාග්විද්‍යාව, භාෂා පරිවර්තන ක්‍රම, දෙවන බස, දෙමළ යන විෂයයන් පිළිබඳ විශිෂ්ට කේන්ද්‍රය ලෙස සැලකෙන කැලණිය විශ්වවිද්‍යාලයේ වාග්විද්‍යා අංශය "ශාස්ත්‍රවේදී (විශේෂ) භාෂා පරිවර්තන අධ්‍යයන" නමින් උපාධි අපේක්ෂකයන් සඳහා පාඨමාලාවක් ඉදිරිපත් කරයි.

එය,

- ✶ **සිව් අවුරුදු වෘත්තීය පාඨමාලාවක්** වන අතර, ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා සපුරාලීමේ ක්‍රියාමාර්ගයෙහි කොටසක් ද වේ.
- ✶ **පාඨමාලාව තුළ ත්‍රිභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන අතර එහි අරමුණ උපාධි අපේක්ෂකයන්ට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙහි ප්‍රවීණතාව ලබා දීමත්, මවු බස පිළිබඳ කුසලතා වර්ධනය කිරීමත් ය.**

පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ ඉහළ යමින් පවතින ප්‍රායෝගික භාෂා පරිවර්තකයන් පිළිබඳ ඉල්ලුම සපුරා ලීම සඳහා ය. එය ඉංග්‍රීසි බසින් සිංහල බසට පරිවර්තනය පුහුණු කිරීමෙන් ඇරඹෙන අතර, පාඨමාලා කාලය අවසන් වන විට සිංහල බසින් ඉංග්‍රීසි බසටත් දෙමළ බසින් සිංහල බසටත් පරිවර්තනය කිරීමේ හැකියාව උපාධි අපේක්ෂකයන්ට ලබා දීම අපේක්ෂිතය. ප්‍රායෝගික පරිවර්තන කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ආයතනික පුහුණුවක් ද ඊට ඇතුළත් කෙරේ. මේ පිළිබඳ උනන්දුවක් දක්වන අපේක්ෂකයන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ඒ සඳහා පහත දැක්වෙන සැලැස්මට අනුකූලව සකසා ගත් ඉල්ලුම් පතක්, පහත දැක්වෙන ලේඛන පිටපත් ද සහිතව තැපැල් මගින් කැලණිය විශ්වවිද්‍යාලයට එවීම අපේක්ෂිතය.

අපේක්ෂකයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිකුත් කළ "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය - 2015/2016 " අත් පොතෙහි අංක **2.2.8** සහ **2.2.8.28** යටතේ දැක්වෙන අවම සුදුසුකම් සපුරා සිටිය යුතුය. ඊට අමතරව, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයදුම්පත් ඉදිරිපත් කළ අපේක්ෂකයන් යථෝක්ත ප්‍රවීණතා පරීක්ෂණයට පෙනී සිට එහි අවම නිර්ණායක සපුරාලීම අපේක්ෂා කෙරේ.

පහත දැක්වෙන අවශ්‍යතා සපුරාලූ අපේක්ෂකයෝ ප්‍රවීණතා පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

(අ) 2015 වර්ෂයේ අ. පො. ස. (උ/පෙ) විභාගයට පෙනී සිට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අත්පොතෙහි උක්ත **2.2.8** හා **2.2.8.28** ඡේදයන්ට අනුකූලව කවර හෝ විෂය ධාරාවකින් විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලබා තිබීම.

**ප්‍රවීණතා පරීක්ෂණය**

අයදුම්කරුවන් පහත දැක්වෙන ආකෘතියට අනුව **A4 ප්‍රමාණයෙන්** පිළියෙල කළ අයදුම්පත් **2016 මැයි මස 16** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් **නියෝජ්‍ය ලේඛකාධිකාරී/විභාග, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය** යන ලිපිනයට එවිය යුතුය. ලියුම් කවරයේ වම් කෙළවරේ **''ශාස්ත්‍රවේදී (විශේෂ) භාෂා පරිවර්තන අධ්‍යයන''** යනුවෙන් සඳහන් කළ යුතු අතර ඉල්ලුම් පත්‍රය සමග පහත දැක්වෙන ලේඛන ද අමුණා තිබිය යුතුය.

I) කැලණිය මහජන බැංකුවේ අංක 055-1001-30667553 දරන ගිණුමට රු. 500/- ක් බැර කොට ලබාගත් බැංකු රිසිට් පත.

II) විදුහල්පති හෝ සාමදාන විනිශ්චයකාරයකු විසින් සිය නිල ලාංඡනය තබා සහතික කරන ලද අ. පො. ස. (උ/පෙළ) 2015 ප්‍රතිඵල හා Z අගය.

III) ඉහත ලේඛනවල හා ඉල්ලුම් පත්‍රයේ තම නම සඳහන් වන ආකාරයේ වෙනසක් ඇතොත්, එකී වෙනස් නම්වලින් හැඳින්වෙන තැනැත්තා/තැනැත්තිය එක් අයෙකු බව තහවුරු කෙරෙන දිවුරුම් ප්‍රකාශයක්.

අදාළ නිර්ණායක හා අවශ්‍යතා සම්පූර්ණ නොකළ අයදුම් පත් ප්‍රතික්ෂේප කෙරේ.

ප්‍රවීණතා පරීක්ෂණය **2016 ජුලි 03 වන ඉරිදා** පැවැත්වෙනු ඇත. පරීක්ෂණයේ අරමුණ අපේක්ෂකයන්ගේ සිංහල හා ඉංග්‍රීසි භාෂා පිළිබඳ ප්‍රවීණතාව ඇගයීම ය.

ලේඛකාධිකාරී,  
කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය  
2016 මැයි 02

**UNIVERSITY OF KELANIYA, SRI LANKA**

**Aptitude Test**

**B.A.(Special) Degree in Translation Studies – 2015/2016**

**(Please fill in English using BLOCK letters)**

1. Full Name of Candidate (Mr. / Ms):
2. Surname of Candidate with Initials:
3. National ID No:
4. Permanent Address:
5. Telephone No.:
6. District in which the candidate sat for the G. C. E. (A/L) Examination 2015:
7. Results at the G. C. E. (A/L) Examination 2015:

   A/L Index No: Z - Score: |__|.|__|__|

   | Subject | Grade | Subject | Grade |
   |---|---|---|---|
   | i. ________ | _________ | iii. _________ | _________ |
   | ii. ________ | _________ | iv. _________ | _________ |

8. G. C. E. (O/L) Examination: Year |__|__|__|__|

   Results for: Sinhala |___| English |___|

9. Program of study applied for university admission (in the order of preference indicated as in the application submitted to the University Grant Commission)

   | | | |
   |---|---|---|
   | i. | ii. | iii. |
   | iv. | v. | vi. |
   | vii. | viii. | ix. |

I certify that the above particulars submitted by me are true and accurate.

……………. ………………………….  
Date Signature of Applicant

**Note:**

i. Please ensure that you include (a) Deposit slip for Rs. 500/- (b) Certified result copies of G.C.E. (A/L) 2015 and Z – Score (c) Affidavit, if documents carry a different name, in your application.

ii. Make sure you include your preference for B.A.(Special) Degree in Translation Studies in your application for admission to the University Grants Commission.